නේටෝ හෙවත් උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයේ 25 වන සමුළුව මෙවර පවත්වනු ලැබුවේ ඇමරිකාවේ දීය. ඇමරිකාවේ තෙවන විශාලතම නගරය මෙන්ම ජනපති බැරැක් ඔබාමාගේ උපන්ගම් ප්‍රදේශය වන චිකාගෝහිදී මැයි 20 සහ 21 දෙදින සමුළුව පවත්වනු ලැබුවේ ඊට එරෙහිව පැවැත්වූ මහජන විරෝධතා චිකාගෝ කැරලි මර්ධන පොලිසිය යොදවා මැඩපවත්වමිනි. මින් පෙර චිකාගෝහි මෙවැනි ජාත්‍යන්තර සමුළුවක් පවත්වා නොතිබුණි. නේටෝ සමුළුව චිකාගෝහි පැවැත්වෙන බව ඇමරිකාව නිවේදනය කරනු ලැබුවේ මැයි මස දෙවන සතියේදීය. ඒ බව වාර්තාවීමත් සමග ඇමරිකාවේ මානව හිමිකම් ක්‍රියාකාරී සංවිධාන ෆේස් බුක් ප්‍රමුඛ සමාජ වෙබ් ජීවිතක්ෂයට පත්විය. පාකිස්ථානය විසින් සිය භූමිය ඔස්සේ ඇෆ්ගනිස්ථානය දක්වා දිවෙන නේටෝ සැපයුම් මාර්ග වසා දමනු ලැබුවේ ඉන් පසුවය. කෙසේ වුවද බිඳ වැටුණු මිතු දම් අලුත් කරගැනීමේ අරමුණින් පාකිස්ථානය ඉකුත් මැයි 15 දින එම සැපයුම් මාර්ග නැවත විවෘත කරනු ලැබීය.

නේටෝ සමුළුවේදී ගත් විශේෂ තීරණයක් වූයේ යුරෝපා රටවල ආරක්ෂාව වෙනුවෙන් මිසයිල ආරක්ෂක පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීමයි. මේ සඳහා ඉදිරිපත් කෙරුණ යෝජනාව සම්බන්ධයෙන් කැරලිකරුවන් මර්ධනය කරන අතර සිරියා ජනපති බෂීර් අල් අසාද් මොනව මොනවා හෝ කියමින් දිගටම සිය බලය රැකගනිමින් ඉදිරියට යන්නට සමත්විය. වරෙක තමන් ඉල්ලා අස්වන්නට සූදානම් බව කියමින් විරෝධතා ව්‍යාපාර දුර්වල කළ හෙතෙම තමන් ඉල්ලා අස්වන්නට සූදානම් නැතැයි නැවත ප්‍රකාශ කළේය. ස්වාධීන මැතිවරණයක් ගැන වරෙක කතා කළ හෙතෙම තවත් වරෙක අරාබි ලීගයේ විසඳුම් යෝජනා පිළිගන්නට සූදානම් බව කීවේය. පසුව නැවතත් ඊට පටහැනිව ප්‍රකාශ නිකුත් කළේය. අල් අසාද් ගේ මේ ක්‍රියා පිළිවෙත හේතුවෙන් කැරලිකරුවන්ට දීර්ඝ කාලයක් තිස්සේ ඇදී යන සටනක නිරත




අඩවි ඔස්සේ සමුළුවට එරෙහිව මහජන විරෝධතා සංවිධානය කරන්නට විය.

සමුළුව ආරම්භක දිනයේ චිකාගෝවේ වීදි බට දහස් ගණන් ජනතාව නේටෝව සිය ප්‍රඥප්තියට පටහැනිව යුද මෙහෙයුම්වල නිරත වන බවට චෝදනා කරමින් මාර්ග අවහිර කරමින් පෙළපාලි පවත්වන්නට විය. කැරලි මර්ධනයෙහි විශේෂ පරිචයක් ඇති බව කියන චිකාගෝ පොලිසියට මෙම විරෝධතා ව්‍යාපාර විසුරුවා හරින්නට නව තාක්ෂණයෙන් යුත් අලුත් අවි ආයුධ පවා යොදාගන්නට සිදුවූ බව වාර්තාවිය. විරෝධතා අතර දැඩි

## ශ්‍රීලාල් සෙනෙවිරත්න

ආරක්ෂක රැකවල් සහිතව නේටෝ සමුළුව සැළසුම් කළ ආකාරයෙන්ම පැවැත්වීමට සංවිධායකයන්ට හැකියාව ලැබිණ. සමුළුවට නේටෝ සමාජික රටවල නියෝජිතයන් 50 දෙනෙකු සහභාගි වූ අතර නේටෝ ප්‍රධානියාගේ විශේෂ ආරාධනයකින් පාකිස්ථාන ජනපති අසීස් අලි සර්දාරිද සමුළුවට සහභාගිවීම විශේෂත්වයකි.

නේටෝ මහ ලේකම් ඇන්ඩර්ස් ෆෝග් රස්මුනෙස් පාකිස්ථාන ජනාධිපතිවරයාට මේ සමුළුවට සහභාගිවන ලෙස ආරාධනා කරනු ලැබ තිබුණේ සමුළුවට තෙදිනකට පෙර දුරකථනයෙනි. ඒ හදිසි ආරාධනාවට හේතුව වී තිබුණේ මාස හයකට ආසන්න කාලයක් තිස්සේ පාකිස්ථානය විසින් වසා දමනු ලැබ තිබූ නේටෝ හමුදා සැපයුම් මාර්ග නැවත විවෘත කිරීමට පාකිස්ථාන රජය ගනු ලැබූ තීරණයයි. බලහත්කාරයෙන් සිය රටට ඇතුළුව අල්-ක්වයිදා නායක ඔසාමා බින් ලාඩන් ඝාතනය කිරීම හේතුවෙන් පාකිස්ථානයත් ඇමරිකාවත් අතර පැවැති මිත්‍රත්වය පළුදු වූ අතර පසුව ඇමරිකානු ඩ්‍රෝන යානාවක් පාකිස්ථාන හමුදා කඳවුරකට එල්ල කළ ප්‍රහාරයකින් සෙබළුන් 24 දෙනෙකු

රුසියාව සිය විරෝධය පලකළද යෝජනාව සම්මත කරගන්නට නේටෝව සමත්විය. ඒ අනුව මිසයිල ප්‍රතිප්‍රහාරක ඇමරිකානු යුද නෞකා රාශියක් යුරෝපා මහද්වීපය ආවරණය වන පරිදි ස්ථාන කීපයක රඳවා තබන්නට බැරැක් ඔබාමා නියෝග කළ බව විදෙස් මාධ්‍ය වාර්තා කළේය. ඒ සමගම තුර්කියේ පිහිටි විශේෂ රේඩාර් පද්ධතියක්ද ක්‍රියාත්මක කෙරිණ. යුරෝපයේ කිසියම් රටකට සතුරු ප්‍රහාරයක් එල්ල වන්නේ නම් මේ නේටෝ මූලස්ථානයෙන් මෙහෙයවන මෙම රේඩාර් පද්ධතිය මගින් ඒ බව වහාම දැනගැනීමට හැකියාව ඇති බව පැවසේ. නේටෝව සිරියාව සම්බන්ධයෙන් කවර ආකාරයේ මැදිහත්වීමක් කරනු ඇතැයිද යන්න සමුළුව අතරවාරයේ බොහෝ දෙනාගේ අවධානයට ලක්වූ කාරණයක් විය. ඉකුත් වසරේ 'අරාබි වසන්තය' දේශපාලන කුණාටුව හමුවේ නේටෝවේ ක්‍රියාකාරිත්වය ඊට හේතුවිය. සිය රජයන්ට එරෙහිව කැරලිගැසූ අරාබි රටවල කැරලිකාර කණ්ඩායම්වලට ආධාර ලබාදෙමින් එම රටවල දේශපාලන වෙනසක් ඇති කිරීමට නේටෝව එවක ප්‍රබල බලපෑමක් කරනු ලැබූවේය. විරෝධතාකරුවන්ට එරෙහිව දරුණුතම ප්‍රතිප්‍රහාර එල්ල කරමින් සිය බලය රැකගැනීමට තැත් කළ ලිබියාවේ අසහාය නායක කර්නල් මුහම්මර් ගඩාෆිට සුනඛයකු සේ බෝක්කුවක් යට සැඟව සිටියදී මිය යන්නට සිදුවූයේ නේටෝව ලිබියාව සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය හේතුවෙනි. එසේ නොවන්නට අදටත් ලිබියාවේ පාලකයා ගඩාෆි වන්නට ඉඩ තිබිණ. 'අරාබි වසන්තය' ට ගොදුරු වූ බොහෝ රටවල දේශපාලන බලය මේ වන විට වෙනස්වී තිබේ. පැවැති රජයන් බිඳවැටී, පාලකයන් බලයෙන් පහවී නව දේශපාලන පරිසරයක් නිර්මාණය වී තිබේ.

එතනට යාගන්නට නොහැකි වූ ප්‍රධානම රටක් වූයේ සිරියාවය. දරුණු ප්‍රතිප්‍රහාර එල්ල කරමින් සිය පාලනයට එරෙහි වන්නට සිදුවූයේ සිරියා අර්බුධයට ජාත්‍යන්තර මැදිහත්වීමක් ද සිදුනොවුණු බැවිනි. එහි වාසිය අල් අසාද්ට හිමිවිය. සියලු පහසුකම් සපයමින් රජයේ හමුදා කැරලිකරුවන්ට එරෙහිව යොදවන්නට ඔහුට හැකිවිය. මේ වෙන විටත් සිරියාවේ පවතින දරුණු අවි ගැටුම එහි ප්‍රතිඵලයයි.

සිරියා අර්බුධය ගැන සඳහන් කරමින් නේටෝ මහ ලේකම්වරයා සමුළුවේ දෙවනි දිනයේ සිය කතාවේදී කියා සිටියේ සිරියාව සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරන්නට නේටෝව සූදානම් නැති බවය. සිරියාවේ අර්බුධය දේශපාලන විසඳුමකින් විසදාගත යුතුය යන්න ඔහුගේ ස්ථාවරය විය. අල් අසාද්ගේ රජය හමුදාව යොදවා විරෝධතාකරුවන් මර්ධනය කරන්නට ගෙන යන ක්‍රියාකලාපය නේටෝව අනුමත නොකරන බවත් එම ගැටුම් හේතුවෙන් සිදුවන සිවිල් වැසියන්ගේ මරණ සම්බන්ධයෙන් කණගාටුවට පත්වන බවත් පැවසූ හෙතෙම වැඩිදුරටත් කියා සිටියේ ඒ එසේ වුවද දේශපාලන විසඳුමක් අවශ්‍ය සිරියා අර්බුධයට නේටෝව මැදිහත් නොවන බවයි.
සිරියාව සම්බන්ධයෙන් වන නේටෝවේ මේ ස්ථාවරය එක් අතෙකින් වැදගත් එකක් ලෙස විග්‍රහ කළ හැකිවුවද මෙහිළා මතුවන ගැටළුවක් තිබේ. සමාන අර්බුධයන්ට මුහුණ දුන් රටවල් දෙකක් වන සිරියාව සහ ලිබියාව සම්බන්ධයෙන් නේටෝව දෙයාකාරයකට කටයුතු කරන්න් මන්ද යන්නයි. ලිබියා අර්බුධයේදී නේටෝවේ දඩිබිඩිය සිරියා අර්බුධයේදී දැකගන්නට නැත. ඒ තුළ ඇති දේශපාලන හේතු කාරනා බොහෝ සියුම් සහ උපායමාර්ගික ඒවා වනවාට කිසිම සැකයක් නැත.

'අරාබි වසන්තය'ට ගොදුරු වූ බොහෝ රටවල දේශපාලන ගමන් මග වෙනස් සමත්වූයේ එහිළා ජාත්‍යන්තරයෙන් හිමිවූ සහයෝගයයි. ඒ අනුව සිරියාවේ ජනතා කැරැල්ල සෙසු රටවල මෙන් ජයග්‍රහණයෙන් අවසන්වේදැයි සැක සහිතය. ■

## 2012 මැයි දිනපොත

02.
මියන්මාරයේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දශක තුනක් තිස්සේ අරගලයක නිරතව සිට ඉකුත් අප්‍රේල් මාසයේ පැවැති අතුරු මැතිවරණයෙන් ජයගත් අවුන් සාන් සූකී සහ ඇය සමග පාර්ලිමේන්තුවට තේරී පත්වූ ඇගේ ඇගේ පක්ෂයේ සෙසු සාමාජිකයන් 33 දෙනෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස දිවුරුම් දෙති.

07. සිරියාව වසර හතලිහකට පසුව පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වයි. ජනතා විරෝධතා හමුවේ බලයෙන් ඉවත්ව නොයා සිරියා ජනපති බෂීර් අල් අසාද් පවත්වන ලද මේ මැතිවරණය ජාත්‍යන්තරය නොමග යැවීමට කළ ප්‍රෝඩාවක් බව කැරලිකාර විපක්ෂ කණ්ඩායම් පවසයි.

රුසියාවේ නව ජනාධිපතිවරයා ලෙස ව්ලැඩිමිර් පුටින් දිවුරුම් දෙයි.

08.
ලිබියාවේ නව රජයේ මූලස්ථාන ගොඩනැගිල්ලට කැරලිකරුවන් පිරිසකගෙන් ප්‍රහාරයක් එල්ල වේ. කැරලිකරුවන් තිස් දෙනෙකුගේ කණ්ඩායමක් එල්ල කළ මෙම ප්‍රහාරයෙන් එක් පුද්ගලයකු ජීවිතක්ෂයට පත්ව තවත් පිරිසක් තුවාල ලැබූහ. ප්‍රහාරය එල්ල කරනු ලැබ තිබුණේ ගඩාෆි පාලනය පෙරළා ලිබියාවේ නව පාලනයක් ඇති කිරීමට සටන් කළ කැරලිකරුවන් කණ්ඩායමකි.

15.
මාස හයක පමණ කාලයක් වසා දමනු ලැබ තිබූ පාකිස්ථානයේ සිට ඇෆ්ගනිස්ථානය දක්වා දිවෙන නේටෝ හමුදා සැපයුම් මාර්ග පාකිස්ථානය යළි විවෘත කරයි. ඇමරිකාවේ ඩ්‍රෝන යානාවකින් පාකස්ථාන හමුදා කඳවුරකට එල්ල කළ ප්‍රහාරයකින් සෙබළුන් 24 දෙනෙකු ජීවිතක්ෂයට පත්වීමෙන් පසු පාකිස්ථානය මෙම සැපයුම් මාර්ග වසා දමනු ලැබීය.

17.
ප්‍රංශයේ නව අගමැතිවරයා ලෙස ජෝන් මාර්ක් අයුරෝල් පත්වෙයි. ප්‍රංශයේ නව ජනපති ෆ්‍රන්සුවා ඕලන්ද විසින් අගමැති ධුරයට පත්කරනු ලැබූ ජෝන් ජර්මන් භාෂා ගුරුවරයෙකි.

21.
නේටෝ හෙවත් උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයේ 25 වන සමුළුව ඇමරිකා ජනපති ඔබාමාගේ ගම් ප්‍රදේශය වන චිකාගෝහිදී පැවැත්වේ.
යේමනයේ සානා නගරයේ පැවැති හමුදා පෙරහුරුවකට එල්ල වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් 50ක් ජීවිතක්ෂයට පත්ව 80 දෙනෙකු පමණ තුවාල ලබති.

23.
අල්-ක්වයිදා නායක ඔසාමා බින් ලාඩන් ඝාතනය කිරීමට ඇමරිකාවේ බුද්ධි අංශයට ඔත්තු දුන් බව කියන පාකිස්ථානයේ කයිබර් ප්‍රාන්තයේ ශල්‍ය වෛද්‍ය ෂකීඩ් අෆ්රිඩි ට එහ ප්‍රාන්තයේ අධිකරණයක් මගින් වසර 33ක සිර දඩුවමක් නියම කරයි.

24.
කැනඩා රජයට එරෙහිව එරට විශ්ව විද්‍යාල සිසුන් මොන්ට්‍රියාල් හි පැවැත්වූ දැවැන්ත උද්ඝෝෂණයකදී සිසුන් 400ක් පමණ පොලිස් අත්අඩංගුවට පත්වේ. ජනතා විරෝධතා සම්බන්ධයෙන් කැනඩා රජය හඳුන්වා දුන් නව නීතියක් මේ විරෝධතාවට හේතුවිය.

26.
සිරියාවේ අභ්‍යන්තර ගැටුම් උත්සන්නවීමෙන් කුඩා දරුවන් 30 දෙනෙකු ඇතුළුව පුද්ගලයන් 92ක් ජීවිතක්ෂයට පත්ව තවත් විශාල පිරිසක් තුවාල ලබති.